**හික්කඩුව නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලී බඩු උපකරණ වටිනාකම යටතේ රු.98,434 ක් වූ ප්‍රාග්ධන නොවන අයිතම 41 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.937,756 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු.22,037,338 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ලේඛනය නිවැරදි කර ගිණුම් නිවැරදි කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.499,928 ක් වූ ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,988,738 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙනස සම්බන්ධව සොයා බලා නිවැරදි කර 2020 ගිණුම සමඟ නිවැරදි කරමි. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| (i) ඉකුත් කාල වලට අදාළව ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.1,942,643 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගත යුතුවේ. | ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිවැරදි කරමි. |
| (ii) අත්තිකාරම් ලේඛනයට අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.142,665 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගත යුතුවේ. | ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිවැරදි කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු රු.656,337 ක් වූ කර්මාන්ත ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුවේ. | කාලයක සිට පැවත එන එම ගැටළු ඉදිරියේ දී නිවැරදි කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.112,157,880 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **(අ)** | **පාර්ලිමේන්තු පනත්** | | | |
| | නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරය 170(1) වගන්තිය. | වරිපනම් බදු නොගෙවන බදුකරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (I) | මුදල් රෙගුලාසි 371 | 2012 වර්ෂයේ නිකුත් කල රු.215,217 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ලේඛන පරීක්ෂා කර බලා, අවශ්‍ය කටයුතු කරමි. |
| (II) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක ඉක්ම වූ වටිනාකම රු.1,735,452 ක් වූ තැන්පතු 255 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ලේඛන පරීක්ෂා කර බලා, අවශ්‍ය කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (III) | මුදල් රෙගුලාසි 1645 | වාහන වලට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | රියදුරන් දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කරමි. |
| **(ඇ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (I) | 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015. | ධාවනයෙන් ඉවත් කල වාහන 03 ක් අපහරණය කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (II) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය. | සභාවේ වාහන 23 ක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවක් සිදු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.5,064,629 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,993,582 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,000,000 | 19,591,873 | 14,778,056 | 33,460,151 | 26,050,000 | 24,668,963 | 22,379,637 | 28,646,834 |
| කුලී | 3,400,000 | 3,387,490 | 3,705,362 | 4,420,126 | 7,036,000 | 6,927,690 | 6,900,143 | 4,737,998 |
| බලපත්‍ර ගාස්තු | 956,000 | 639,610 | 730,174 | 272,180 | 1,846,000 | 1,107,260 | 1,243,830 | 362,744 |
| | 22,356,000 | 23,618,973 | 19,213,592 | 38,152,457 | 34,932,000 | 32,703,913 | 30,523,610 | 33,747,576 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.10,000 ට වඩා වැඩි හිඟ ශේෂ පවතින වරිපනම් ඒකක 183 කින් අයවිය යුතු ශේෂය රු.15,014,791 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුවේ. | හිඟ පාර්ශවයන් වෙත රතු නිවේදන යවා ඇති අතර, ජංගම සේවා සහ ආදායම් පරීක්ෂකවරුන් මගින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.244,078 ක් හා මුද්දර ගාස්තු රු.57,487,618 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසළ කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී නව ව්‍යාපෘතියක් මගින් අදාළ ගැටළුව විසඳන බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් සෞඛ්‍ය කම්කරු සේවකයින් 04 දෙනෙකුගෙන් වර්ෂ 03 කට අදාළව අයවිය යුතු රු.48,297 ක් අයකර ගෙන නොතිබුණි. | අදාළ අයකිරීම් කල යුතුවේ. | ඉදිරියේ දී අය කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| (i) | අනුමත තනතුරු අනුව පුරප්පාඩු 31 ක් හා අතිරික්ත 62 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට හා අතිරික්ත තනතුරු විධිමත් කරගත යුතුවේ. | ලිපි මගින් අදාළ අංශ දැනුවත් කර ඇති බව හා මැතිවරණය හේතුවෙන් බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 25/2014 කළමනාකරණ චක්‍රලේඛයට පටහැනිව අනියම් හා ආදේශක සේවකයින් 59 දෙනෙකු බඳවාගෙන 2019 වර්ෂය තුළ වැටුප් වශයෙන් රු.14,154,321 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | පිළිතුරු දී නැත. |

**(ආ) සේවක ණය**

-----------------

| | | | |
|---|---|---|---|
| (i) | සභාවේ අනියම් හා ආදේශක සේවකයින් 11 දෙනෙකු වර්ෂ 12 කට පෙර ලබාගත් සේවක ණය අත්තිකාරම් රු.40,400 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | ලිපි මගින් දැනුවත් කර ඇති අතර, හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | විශ්‍රාම ගිය හා සේවය හැරගිය සේවකයින් 04 කගේ සේවක ණය රු.56,202 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | ලිපි මගින් දැනුවත් කර ඇති අතර, හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

------------------------------

**3.4.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ධාවන තත්ත්වයේ පවතින රු.3,000,000 ක වටිනාකම වූ ගලි බවුසරය ලියාපදිංචි කර නොමැති හෙයින් 2013 වර්ෂයෙන් පසු ධාවනය කර නොතිබුණි. | ලියාපදිංචි කර ධාවනය සඳහා යොදවා ගත යුතුවේ. | මාර්ග පටු බැවින් ධාවනය කළ නොහැකි නිසා වාහන අංගනයේ නතර කර ඇති අතර, ඉදිරියේ දී ධාවනය කිරීමට අපේක්ෂා කරමි. |
| (ii) | 2005 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 300 ක වියදමින් ඉදිකරන ලද පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ උඩුමහලේ කඩ කාමර 17 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ගොඩනැගිල්ලේ කඩ කාමර කුලියට දීමෙන් ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභා රැස්වීමේ දී මේ පිළිබඳ තීරණයක් ගැනීමට යෝජනා කළ බව දන්වමි. |

**3.5** **ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ නගර සභාව රු.2,806,378 ක ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ නමුත්, එම මිලදී ගැනීම් සම්බන්ධව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරිණිය වෙනත් රාජකාරි කටයුතු කරන බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | රට තුළ පැවති අයහපත් තත්ත්වය නිසා එම කටයුතු ප්‍රමාද වූ බව දන්වමි. |